أحكام الحج والعمرة ـ سنهالي

හජ් හා උම්රා කර්තව්‍යය



المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالزلفي

73 هاتف: ٤٢٢٤٤٦٦ ٠١٦ . فاكس: ٤٢٢٤٤٧٧ ٠١٦

تعاوني الزلفي

أحكام الحج والعمرة

أعده وترجمه للغة السنهالية

شعبة توعية الجاليات بالزلفي

الطبعة الثانية: ٦/١٤٢٤

ح شعبة توعية الجاليات بالزلفي ، ١٤٢٠ هـ
فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

شعبة توعية الجاليات - الزلفي
أحكام الحج والعمرة - الزلفي
٦٠ ص ؛ ٨/١٢ سم
ردمك : ٨ - ٧٣ - ٨١٣ - ٩٩٦٠
(النص باللغة السنهلية)
١- الحج ٢- العمرة
٣- زيارة المسجد النبوي أ - العنوان

ديوي ٢٥٢,٥ ٢٠/٩٧١٨

رقم الإيداع ٢٠/٣٧١٨
ردمك : ٨ - ٧٣ - ٨١٣ - ٩٩٦٠

الصف والإخراج: **شعبة توعية الجاليات بالزلفي**

محتويات – أحكام الحج والعمرة

පටුන

1-හජ් හා එහි විශේෂත්වය - 5
2-හජ් හි කොන්දේසි - 7
3-හජ් හි පිළිවෙල් - 8
4-ඉහ්රාම් කිරීම / මීකාත් - 10
5-ඉහ්රාම් හි සුන්නත් - 12
6-හජ් හි ක්‍රම - 13
7-ඉහ්රාම් හි ක්‍රම - 16
8-තහනම් කරුණු - 18
9-තවාෆ් කිරීම - 20
10-තවාෆ් හි ක්‍රම - 22
11-තවාෆයෙන් පසු - 25
12-සඊ කිරීම - 26
13-දුල්හජ් 8 හා 9 වන දින - 30
14-මුස්දලිෆාව / ඊද් දිනය - 32
15-11 වන දිනය / ගල් ගැසීම - 35
16-12 වැනි දිනය - 36
17-අර්කාන් හා වාජිබාත් - 38
18-නබිතුමාගේ මස්ජිදය - 39
19-උම්රා කර්තව්‍යය - 41

أحكام الحج والعمرة

හජ් හා එහි විශේෂත්වය

මුස්ලිම් පිරිමින් හා ස්ත්‍රීන් සෑම දෙනාට තම ජීවිතයේ එක්වරක් හජ් කර්තව්‍යය ඉටු කිරීම අනිවාර්ය වේ. මෙය ඉස්ලාම්හි පස්වන අනිවාර්ය කරුණෙකි. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

තවද, කවරෙක් හෝ එහි ගමන් කිරීමට ශක්තිය ලද වුන්ව සිටින්නේද, (එවන් අයට) අල්ලාහ් වෙනුවෙන් (එහි) ගමන් කර හජ් කර්තව්‍යය ඉටුකිරීම අනිවාර්යවේ.

(අල්කුර්ආන්-3:97)

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

ඉස්ලාම් (නමැති ගොඩනැගිල්ල) කුළුණු පහක් මත ගොඩනගා ඇත. 'ඒවා අල්ලාහ්

හැර වන්දනාමානයට සුදුස්සා අන් කවරෙක් හෝ නොමැති බවත්, නබිනායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ වහලාද දූතයාද බවත් සාක්ෂි දැරීම, සලාතය (නැමදුම) ඉටු කිරීම, සකාතය ගෙවීම, හජ් කර්තව්‍යය ඉටු කිරීම හා රමලාන් උපවාසයේ යෙදීම' යනාදීන්ය.

(ග්‍රන්ථය : බුහාරි)

හජ් කර්තව්‍යය උදෙක්ම අල්ලාහ් ලඟාවීමට අයත් ක්‍රියාවලින් උතුම් ක්‍රියාවෙකි. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

කවරෙක් හෝ (ස්ත්‍රීන් සමග) ආශ්වාදයේ නොයෙද, පාප ක්‍රියාවන්ද නොකර, හජ් කර්තව්‍යය ඉටු කරන්නේද, ඔහු (තම සියලු පාප යෙන් නිදහස්වී) එදින උපන් බිළිඳකු ලෙස පැමිණේ.

(ග්‍රන්ථය : මුස්නදුන් තයාලිසී)

හජ් හි කොන්දේසි

බුද්ධියලත්, වයසට පත් එමෙන්ම හජ් කර්තව්‍යය ඉටු කිරීමට (ආර්ථික ශක්තියද ඇතුලුව) ශක්තියක් ඇති මුස්ලිමෙකුට හජ් කර්තව්‍යය ඉටුකිරීම අනිවාර්ය වේ.

ශක්තිය යනු, වියදම් කිරීමට හා ගමන් කිරීමට ශක්තිය තිබීමකි. එනම් ගමන් කිරීමට අවශ්‍ය වාහන පහසුකම්ද යාම, ඒමේදී කෑමබීම, ඇඳුම් පැළඳුම් වැනි දේ සඳහා වියදම් කිරීමට හැකියාවක් තිබිය යුතුයි.

මෙම මුදල් තම යටතේ ජීවත්වන යැපෑන්නන්ගේ අවශ්‍යතාවයට වඩා අතිරේකව පවතිය යුතුයි. ගමන් මාර්ගයෙහි බිය නොවීම සහ හජ් කර්තව්‍යය ඉටු කිරීමට බාධාවන් වශයෙන් පවතින විපතෙන් හෝ ලෙඩෙන් තොර ශරීර ආරෝග්‍යයෙන් සිටීමද වැදගත් වේ

ස්ත්‍රීන්ට ඉහත සඳහන් කොන්දේසිවලට අමතරව ඔවුන් හා සමග ඔවුන්ගේ සැමියන් හෝ වෙනත් මහ්රම් (විවාහවීමට තහනම්වූ ඥාති) කෙනෙක් සිටීමද කොන්දේසියෙකි.

එසේම, ඇය ඉද්දාවේ නොසිටින අයෙකු විය යුතුයි. මන්ද යත්, ඉද්දාවෙහි සිටින්නන් සිය නිවසෙන් පිටත්වීම අල්ලාහ් තහනම් කර ඇත. මෙවැනි බාධාවන් කිසිවක් හෝ ඇති අයට හජ් කර්තව්‍යය ඉටුකිරීම වාජිබ් (අනිවාර්ය) නොවන්නේය.

හජ් කිරීමේ පිළිවෙල්

1-හජ් කරන්නා ගමන් කිරීමට පෙර හජ් හා උම්රා පිළිබඳ මනා අවබෝදයක් පොත් පත් කියවා හෝ ආගමික විද්වතුන්ගෙන් විමසා (අසා) හෝ දැනගැනීම.

2-පුණ්‍ය කර්මයෙහි තමාට උපකාර කරන යහපතුන් සමග මිත්‍රවීමට උනන්දු වීම සහ

ආගමික පූජක වරයා හෝ ආගමික දැනුම ලද අය හෝ සමග යාම.

3-තම හජ් කර්තව්‍යය අල්ලාහ් වෙනුවෙන් හා ඔහු කරා ලඟාවීමට බව සිතීම.

4-අනවශ්‍ය කතා බහවල නොයෙදීමෙන් තම දිව රැක ගැනීම.

5-දික්ර් (භාවනා) හා දුආ (ප්‍රාර්ථනා) අධික වශයෙන් කිරීම.

6-මිනිසුන්ට බාධා කිරීමෙන් වැළකී සිටීම.

7-ස්ත්‍රීන් තමන් ආවරණය කිරීමටද හිජාබ් ඇඳීමටද උනන්දුවීම හා පිරිමින් ගැවසෙන තැනින් ඈත්වී සිටීම.

8-හජ් කර්තව්‍යයෙහි යෙදී සිටින්නා තමා අල්ලාහ්ගේ ඇදහීමේ යෙදී සිටින බව සිතා ගත යුතු අතර මෙය විනෝද ගමනක් ලෙස නොසිතිය යුතුයි. මන්දයත් හජ්හි යෙදෙන සමහරු (අල්ලාහ් යහමග පෙන්වනු මැන) හජ් කර්තව්‍යය විනෝදයට අවස්ථාවක් ලෙස සිතමින් ඡායා රූපද ගන්නෝය.

ඉහ්රාම් කිරීම

ඉහ්රාම් යනු, හජ් සහ උම්රා කර්තව්‍ය යෙහි පිවිසීමකි. හජ් හෝ උම්රාවෙහි යෙදීමට අදහස් කරන්නා ඉහ්රාම් කිරීම අනිවාර්ය වේ. හජ් හෝ උම්රාවෙහි යෙදෙන්නා මක්කා නගරයෙන් පිට සිට පැමිණෙන්නේ නම්, ඔවුහු නබි මුහම්මදු (සල්) තුමා නියම කළ මීකාත් එකකදී ඉහ්රාම් කළ යුතුයි.

මීකාත් - මායිම්

1-තුල් හුලයිෆා :

මෙය මදීනාවට යාබදව පිහිටා ඇති කුඩා ගමකි. මෙය දැනට අබ්යාර් අලි යනු නමින් හැඳින්වේ. මෙය මදීනා වාසීන්ගේ මීකාත්ය.

2-අල් ජුහ්ෆා :

මෙය රාබිහ් ප්‍රදේශයට යාබදව පිහිටා ඇති කුඩා ගමකි. දැනට මිනිසුන් රාබිහ් සිට

ඉහ්රාම් කරති. මෙය ෂාම් (සිරියා) වාසීන්ගේ මීකාත්ය.

3-කර්ණුල් මනාසිල් (අස්සයිලුල් කබීර) :

මෙය තායිෆ් නගරයට යාබදව පිහිටා ඇති ස්ථානයකි. මෙය නජ්ද් වාසීන්ගේ මීකාත්ය.

4-යලම්ලම් :

මෙය මක්කා නගරයේ සිට කිලෝ මීටර 70 ක තුදුරින් පිහිටා ඇති ස්ථානයකි. මෙය යෙමන් වසීන්ගේ මීකාත්ය.

5-දාතු ඉර්ක් :

මෙය ඉරාක් වැසියන්ගේ මීකාත්ය.

මෙම මීකාතයන් සියල්ල ඉහත සඳහන් වැසියන් හා එම මීකාත් මාර්ගයෙන් හජ් හා උම්රා කර්තව්‍යය ඉටුකිරීම සඳහා පැමිණෙන් නන් සඳහා නබි මුහම්මදු (සල්) තුමා නියම කළ මායිම් වෙ. මක්කාවෙහි සිටින්නන් හා හිල්හි (හරම් හි පිටත වසන) ප්‍රදේශ වාසීන්

තමන් සිටින ස්ථානයෙහි සිටම ඉහ්රාම් කළ හැක.

ඉහ්රාම් හි සුන්නත්

ඉහ්රාම් කිරීමට පෙර කළයුතු සතුටුදායක කාර්යයන් මෙසේය.

1-නියපොතු කපා ගැනීම, කිහිල්ල දෙකහි රෝමයන් ගැලවීම හෝ බූගෑසීම, උඩුරැවුල කැපීම, ආවරණ ප්‍රදේශයේ රෝම බූගෑසීම, නෑම හා සුවඳ විලවුන් ගෑම යනාදීන්. සුවඳ විලවුන් ගෑම ඇඳුමෙන් තොරව ශරීරයට පමණක් විය යුතුයි.

2-මැසූ ඇඳුම් ගැලවීම හා උඩු (සළුව) සහ යටි (සරම) ඇඳුම් ඇඳීම. ස්ත්‍රීන් තම ශරීරය ආවරණය කිරීමට උනන්දු විය යුතු අතර, තමන් කැමැති ඇඳුම්ද ඇඳිය හැක. තම අලංකාර නොපෙන්වීම, අන් පිරිමින් පැමිණෙන අවස්ථාවල තම මුහුණු හා බාහුවන්

ආවරණය කිරීම හා අත් වැසුම සහ මුහුණු වැසුම පැළඳීමෙන් වැළකී සිටීම.

3-මස්ජිදයට යාම. එය අනිවාර්ය සලාතයේ වේලාව නම්, එම සලාතය ජමාඅත් (සමූහ) වශයෙන් ඉටුකිරීම. එය සලාතයේ වේලාව නොවන්නේ නම්, වුලූවෙහි (දෝවනයෙහි) සුන්නතයක් වශයෙන් රකඅත් දෙකකින් සමන්විත සලාතයක් ඉටු කිරීම. පසුව ඉහ්රාම් කිරීම.

හජ් හි ක්‍රම

1-හජ් අත්තමත්තුඋ :

මෙය උම්රා වෙනුවෙන් පමණක් ඉහ්රාම් කිරීම මෙතවින් හැඳින් වේ. පසුව හජ් හි වේලාව පැමිණ විට හජ් වෙනුවෙන් මක්කා වේ නම ස්ථානයේ සිටම හජ්හි යෙදෙන්නා ඉහ්රාම් කළ යුතුයි. මීකාතයේ 'ලෙබ්බයික උම්රතන් මුතමත්තිඅන් බිහා ඉලල් හජ්' (යා

අල්ලාහ්, උම්රාව හජ් සමග නිය්යත්කර ඔබ ඉදිරියේ පැමිණ සිටිමි) යැයි කිව යුතුයි.

හජ් කාලයට පෙර හජ් කිරීම සඳහා මක් කාවට පැමිණෙන අයට මෙම ක්‍රමය උතුම්ය. පසුව මක්කාවේ තම ස්ථානයෙහි සිට හජ් කර්තව්‍යය සඳහා නැවත වරක් ඉහ්රාම්කර ලෙබ්බයික හජ්ජන් (යා අල්ලාහ්, හජ් කර් තව්‍යය සඳහා නියියත් කරමින් ඔබ ඉදිරියට පැමිණ සිටිමි) යැයි කිව යුතුයි. මෙම ක්‍රමයේ (සතෙක් කැපකර) කුර්බාන් දීම හජ් කරන් නාට අවශ්‍යවේ. පුද්ගලයෙක් වෙනුවෙන් එළු වෙක්ද, පුද්ගලයන් හත් දෙනෙක් වෙනුවෙන් ඔටුවෙක්ද හෝ ගවයෙක්ද කුර්බාන් කැපීම් කළ යුතුය.

2-හජ් අල් කිරාන් :

මෙය හජ් හා උම්රා කර්කව්‍යය සඳහා එකට නියියත් කිරීමයි. එවිට ලෙබ්බයික උම් රතන් ව හජ්ජන් (යා අල්ලාහ් මම හජ් හා

උම්රාව සඳහා නියියත් කර ඔබ ඉදිරියෙහි පැමිණ සිටිමි) යනුවෙන් කිව යුතුයි. මෙය උම්රාව ප්‍රථමයෙන් ඉටු කර එම ඉහ්රාම යෙන්ම නහ්ර් (දුල් හජ් මස 10 වන) දිනය තෙක් සිටීමයි. මෙය උම්රා හජ් සමග එකතු කිරීමකි. මෙය වැඩි වශයෙන්, හජ්හි වේලාව පැමිණ විට උම්රාවෙන් නිදහස්වී හජ් වෙනු වෙන් ඉහ්රාම් කිරීමට ප්‍රමාණවත් නොවන කෙටි කලකට පෙර පැමිණෙන අය සඳහාය. මෙම හජ් සඳහාද කුර්බාන් දිය යුතුයි.

3-හජ් අල් ඉෆ්රාද් :

මෙය හජ් කර්තව්‍යය වෙනුවෙන් පමණක් නියියත් කිරීමයි. මීකාතයෙහි නියියත් කර ලෙබ්බයික හජ්ජන් (යා අල්ලාහ්, මම හජ් කර්තව්‍යය වෙනුවෙන් නියියත් කර ඔබ ඉදි රියෙහි පැමිණ සිටිමි) යැයි කිව යුතුයි. මෙම හජ් සඳහා කුර්බාන් දීම අනවශ්‍ය වේ.

ගුවන් මාර්ගයෙන් ගමන් කරන්නා මීකා තයේ හෝ එය දැන ගැනීමට අපහසුවන්නේ නම්, මීකාතයට පැමිණීමට පෙර ප්‍රමාණවත් කාලයේ හෝ ඉහ්රාම් කළ යුතුය. මීකාතයේ කළ යුතු පිරිසිදු කිරීම, සුවඳ විළවුන් ගෑම, නියපොතු කැපීම සහ ඉහ්රාම් ඇඳුම් ඇඳීම යනාදියන් කැමැත්ත පරිදි ගුවන් යානයෙහි නැගීමට පෙර හෝ ගුවන් යානය තුල හෝ සම්පූර්ණයෙන් කළ හැක. පසුව මීකාතය ලඟාවීමට පෙර හෝ ලඟාවූවිට හෝ ඉහ්රාම් කිරීම සඳහා නියියත් කළ යුතුයි.

ඉහ්රාම් හි ක්‍රම

ඉහ්රාමයේ ක්‍රමයන් අනුව පහත සඳහන් පරිදි උසුරිය යුතුයි.

1-හජ් තමත්තුඋ කිරීමට අදහස් කරන්නා (ලෙබ්බයික උම්රතන් මුතමත්තිඅන් බිහා ඉලල් හජ්) යනුවෙන් උසුරීම.

2-හජ් අල්කිරාන් කිරීමට අදහස් කරන්නා (ලෙබ්බයික උම්රතන් ව හජ්ජන්) යනුවෙන් උසුරීම.

3-හජ් අල් ඉෆ්රාද් කිරීමට අදහස් කරන්නා (ලෙබ්බයික හජ්ජන්) යනුවෙන් උසුරීම.

ඉහ්රාම් කළායින් පසු තල්බියා උසුරීම හා එය ඉහ්රාම් කළ සිට කඃබාවේ තවාෆය (වට කිරීම) ආරම්භ කරන තෙක්ම නැවත නැවත උසුරීම සුන්නත්ය. එය මෙසේය.

لَبَّيْكَ اللَّهُمَّ لَبَّيْكَ ، لَبَّيْكَ لا شَرِيْكَ لَكَ لَبَّيْكَ ، إِنَّ الْحَمْدَ وَالنِّعْمَةَ لَكَ وَالْمُلْكُ لا شَرِيْكَ لَكَ.

ලෙබ්බයික් අල්ලාහුම්ම ලෙබ්බයික් ලෙබ්බයික් ලාෂරීකලක ලෙබ්බයික් ඉන්නල් හම්ද වන්නි:මත ලක් වල්මුල්ක් ලාෂරීක ලක්.

ඔබ වෙත පැමිණ සිටිමි. යා අල්ලාහ්, ඔබ වෙතම පැමිණ සිටිමි. ඔබ වෙතම මා පැමිණ සිටිමි. ඔබට කිසිඳු සහකරුවෙක් නොමැත.

ඔබ වෙතම මා පැමිණ සිටිමි. නිසැකයෙන්ම ප්‍රශංසාව, දායාදය සහ පාලනය ඔබ සතුය. ඔබට කිසියම් සහකරුවෙක් නොමැත.

ඉහ්රාම් හි තහනම් කරුණු

ඉහ්රාම් කළ අයට ඉහ්රාම් කිරීමට පෙර අනුමතවූ සමහර කාර්යයන් තහනම් වේ. මක්නිසාද යත්, ඔහු ඇඳහීමෙහි පිවිස සිටී. ඔහුට පහත සඳහන් කාර්යයන් තහනම්ය.

1-හිසකෙස් හා ශරීරයෙහි ඇති රෝම ඉවත් කිරීම. නමුදු අවශ්‍යතාවය මත පහසුවෙන් හිස කැසී(ම මගින් රෝම හැලී)මෙන් ප්‍රශ්නයක් නොමැත.

2-නියපොතු කැපීම. නමුත්, එය කැඩී හෝ බාධවක් ලෙස හෝ පවතින්නේ නම්, එය ඉවත් කිරීමෙන් ප්‍රශ්නයක් නොවන්නේය.

3-සුවඳ විලවුන් සහ සුවඳ සබන් යනාදියන් භාවිතා කිරීම.

4-ලිංගික ආශ්වාදයන්හි යෙදීම සහ විවාහ කිරීම, කාම හැඟීමෙන් බැලීම, ආලිංගනය කිරීම, සිඹීම හා මෙවැනි ලිංගික ආශ්වාද උනන්දු කරන කාර්යයන්හි යෙදීම.
5-අත් දෙකට අත් (මේස්) වැසුම් පැළඳීම.
6-දඩයම් සතුන් මැරීම.

මේවා සියල්ල පිරිමින් හා ස්ත්‍රීන් දෙපිරිස ටම තහනම්ය. නමුත්, මෙයට අමතරව පිරිමින්ට පහත සඳහන් කාර්යයන්ද තහනම්ය.

1-මැසූ ඇඳුම් ඇඳීම. නමුදු ඉහ්රාම්කර සිටින අයට අවශ්‍ය පටිය, අත්ඔරලෝසුව හා ඇස් කණ්නාඩිය යනාදීන් පැළඳීමෙන් ප්‍රශ්නයක් නොමැත.
2-හිසට ගැවෙන පරිදි හිස් වැසුම් පාවිච්චි කිරීම. එනමුත් හිසට නොගැවෙන කුඩය, වාහනය, කුඩාරම යනාදීන් පාවිච්චි කිරීමෙන් ප්‍රශ්නයක් නොමැත.
3-පා වැසුම් පැළඳීම. පාවහන් නොවන්නේ නම්, සපත්තුව පැළඳිය හැක.

මෙවායින් කිසියම් කාර්යයක් කරන්නා ස්ථාවර තුනකට ඇතුලත් වෙති.

අ-හේතුවකින් තොරව කරන්නා. ඔහු පව් කාරයාය. ඔහු ප්‍රතිකාරයක් කළ යුතුයි.

ආ-අවශ්‍යතාවයක් මත කරන්නා. ඔහු පව් කාරයා නොවන්නේය. එනමුත් ඒ සඳහා ඔහු ප්‍රතිකාරයක් කළ යුතුයි.

ඉ-නොදැනීම, අමතක වීම, බල කිරීම හෝ මෙවන් හේතු මත කරන්නා. ඔහුට පවක් නොමැත. ඔහු ඒ සඳහා ප්‍රතිකාරයක් කළ නොයුතුයි.

තවාෆ් කිරීම

මස්ජිදුල් හරාම් මස්ජිදයට පිවිසෙන විට දකුණු පය තබා මෙසේ උසුරීම සුන්නත්ය.

බිස්මිල්ලාහි වස්සලාතු වස්සලාමු අලා රසූලිල්ලාහි, අල්ලාහුම් මඟ්ෆිර්ලී දූනූබී වෆ් තහ්ලී අබ්වාබ රහ්මතික.

بِسْمِ اللهِ وَالصَّلَاةُ وَالسَّلَامُ عَلَى رَسُوْلِ اللهِ، اَللّٰهُمَّ اغْفِرْلِيْ ذُنُوْبِيْ وَافْتَحْ لِيْ أَبْوَابَ رَحْمَتِكَ.

අල්ලාහ්ගේ නාමයෙන් පිවිසීමි. සාමය හා සමාදානය අල්ලාහ්ගේ දූතයා වෙත හිමිවනු මැනවි. ස්වාමිනී, මගේ පාපයන් වෙනුවෙන් සමාව ලබාදී ඔබගේ කරුණාවේ දොරටුව මා වෙනුවෙන් විවෘත කර දෙනු මැනවි.

මෙම ප්‍රාර්ථනාව සියළුම දේවස්ථානයටම පොදුය. පසුව තවාෆ් කිරීම සඳහා කෑබාව දෙසට මුහුණපා සිටිය යුතුයි.

තවාෆ් යනු, අල්ලාහ්ට වැඳුම් පිදුම් කිරීමේ චේතනාවෙන් හජ්රුල් අස්වද (කළු ගලෙන්) ආරම්භය හා අවසානය වන පරිදි කෑබාව තම වමට එනුසේ හත් වරක් කෑබාව (සක් මන්) වටේ ගමන් කිරීමකි. මේ වෙනුවෙන් වුලූකර සිටීම (වාජිබ්) අනිවාර්ය වේ.

තවාෆ් හි ක්‍රම

1-හජරුල් අස්වද් (කළුගල) දෙසට ගොස් එය තම දකුණු අතින් අල්ලා 'බිස්මිල්ලාහි වල්ලාහු අක්බර්' යැයි උසුරිය යුතු අතර, පහසු වන්නේනම්, එය සිඹිය යුතුයි. එයට පහසු නොවන්නේ නම්, එය අතින් අල්ලා එම අත සිඹිය යුතුයි. එය ඇල්ලීමටද පහසු නොවන්නේ නම්, ඒ දෙසට මුහුණපා තම අත් සංඥා කර අල්ලාහු අක්බර් යනුවෙන් උසුරිය යුතු අතර, අත නොසිඹිය යුතුයි.

පසුව කඃබාව තමාගේ වමට යොදා තවාෆය ආරම්භ කළ යුතුයි. තමා කැමැති දුආවන් ප්‍රාර්ථනා කළ හැකිය. නොඑසේ නම්, තමා දන්නා තරම් අල්කුර්ආනය පාරායනා කළ හැක. හජ් කරන්නා තම භාෂාවෙන් තමා හා තමා කැමැති අය වෙනුවෙන් ප්‍රාර්ථනා කළ හැක. මෙහි ප්‍රාර්ථනා කිරීමට විශේෂ ප්‍රාර්ථනාවන් නොමැත.

2-රුක්නුල් යමානී වෙතට පැමිණි විට පහසු වුවද, එය අතින් අල්ලා බිස්මිල්ලාහි වල්ලාහු අක්බර් යනුවෙන් උසුරිය යුතු අතර, තම අත නොසිඹිය යුතුයි. එයට අපහසු වන්නේ නම්, අඛණ්ඩව ගමන් කරමින් සිටින අතර තුර, තම අතින් සංඥා නොකර තක්බීරයද නොකිව යුතුයි. එය (රුකුනුල් යමානී) හා හජරුල් අස්වද් අතරෙහි මෙසේ ප්‍රාර්තනා කළ යුතුයි.

رَبَّنَا آتِنَا فِي الدُّنْيَا حَسَنَةً وَّفِي الْآخِرَةِ حَسَنَةً وَّقِنَا عَذَابَ النَّارِ

රබ්බනා ආත්තිනා ෆිද් දුන්යා හසනතන් ව ෆිල් ආ(ක්)හිරති හසනතන් වකිනා අදා බන්නාර්

යා අල්ලාහ්, මෙලොවෙහිද පරලොවෙහි ද යහපත ලබාදෙනු මැනවි. තවද, නිරයෙහි වේදනාවෙන් රැකගනු මැනවි.

3-හජරුල් අස්වද් වෙත පැමිණවිට එය තම අතින් ඇල්ලිය යුතුයි. එය අපහසු වන්නේ නම්, තම අතින් සංඥාකර අල්ලාහු අක්බර් යනුවෙන් කිව හැක. මෙසේ කිරීමෙන් තවාෆ්හි සක්මන් එකක් අවසන්වේ. ඉතිරි වටකිරීම්ද මෙසේම සම්පූර්ණ කළ යුතුයි.

4-තවාෆය කරමින් සිට වටකිරීම් හතම සම්පූර්ණවන තෙක් පළමු වටයෙහි කළ පරිදිම කළ යුතුයි. හජරුල් අස්වද පසුකරන සෑම විටද, හත්වන වටයෙන් පසුද අල්ලාහු අක්බර් යනුවෙන් තක්බීරය කිව යුතුයි.

ප්‍රථම වට තුනකදී කුඩා අඩි තබාගෙන වේගයෙන් ගමන් කිරීම සුන්නත්ය. මෙය අල් රම්ලු යනුවෙන් හැඳින්වේ. ඉතිරි වටවල සාමාන්‍යයෙන් ඇවිදීම සුන්නත්ය.

එසේම, මෙම තවාෆ් සෑමහිම සළුව තමාගේ දකුණු කිහිල්ල මාර්ගයෙන් ගෙන එහි කොණ් දෙක වම් උරහිස මත තබා වසාගත යුතු අතර, දකුණු උරහිස පමණක් විවෘතව

පවතිය යුතුයි. මෙය අල් ඉල්තිබාඋ යනුවෙන් හැඳින්වේ. අල් රම්ලු (කුඩා අඩි තබා ගමන් කිරීම) හා අල් ඉල්තිබාඋ (සළුව පිළිවෙලට ඇඳීම) හජ් හා උම්රා කර්තව්‍යය වෙනුවෙන් මක්කාවට පිවිසෙනවිට කරන ප්‍රථම තවාෆය සඳහා පමණි.

තවාෆයෙන් පසු

තවාෆය කිරීමෙන් පසු මකාමේ ඉබ්රාහීම් මෙහි පිටුපස රකඅත් දෙකකින් සමන්විත සලාතයක් ඉටු කිරීම සුන්නත්ය. මෙම අවස්ථාවේ මකාමය ඔහුට සහ කඃබාවට අතරව පවති. සලාතයට පෙර සළුව ඇඳිය යුතුයි. එනම් සළුව උරහිස බාහුවන් දෙක හා පපුව මත තබා වසාගත යුතුයි.

පළමු රකඅතෙහි ෆාතිහා හා කාෆිරූන් පරිච්ඡේදයන්ද, දෙවැනි රකඅතෙහි ෆාතිහා හා ඉහ්ලාස් පරිච්ඡේදයන්ද පාරායනය කළ

යුතුයි. අධික තදබදය හේතුවෙන් මකාමෙහි පිටුපසින් සලාතය ඉටු කිරීමට අපහසු නම්, දේවස්ථානයේ කුමන ස්ථානයක හෝ එය ඉටුකළ හැක. පසු සම්සම් ජලය වැඩියෙන් (කුස පිරන තෙක්) පානය කිරීම සුන්නත්ය.

සඊ කිරීම

සම්සම් ජලය පානය කිරීමෙන් පසු සඊ (සක්මන්) කරන ස්ථානයට යා යුතුයි. එනම් (සඊ කිරීමේදී හමුවන පළමු කඳු ගැටයවන) සෆා වෙත ගොස් එය ලඟාවූ විට පහත සඳහන් කුර්ආන් පාඨය පාරායනා කළ යුතුයි.

[١٥٨ :٢] ﴿إِنَّ الصَّفَا وَالْمَرْوَةَ مِنْ شَعَآئِرِ اللهِ﴾

ඉන්නස් සෆා වල්මර්වත මින් ෂආඉරිල්ලාහ්

නියතව, සෆා හා මර්වා (යන කඳු ගැට) අල්ලාහ්ගේ චිහ්න (සළකුණු) යන් අතරවේ.

(අල්කුර්ආන්-2:185)

අනතුරුව කඃබාව පෙණෙන තෙක් සෆා කඳු ගැටයට නැග කඃබා දෙසට හැරී දෑත් ඔසවා අල්ලාහ් ප්‍රශංසා කර කැමති ප්‍රාර්ථනාවන් කළ හැක. ප්‍රාර්ථනාවක් මෙසේය.

لاَ إِلَهَ إِلاَّ اللهُ وَاللهُ أَكْبَرْ، لاَ إِلهَ إِلاَّ اللهُ وَحْدَهُ لاَ شَرِيْكَ لَهُ ، لَهُ الْمُلْكُ وَلَهُ الْحَمْدُ يُحْيِيْ وَيُمِيْتُ وَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِيْرٌ ، لاَ إِلَهَ إِلاَّ اللهُ وَحْدَهُ أَنْجزَ وَعْدَهُ وَنَصَرَ عَبْدَهُ وَهَزَمَ الْأَحْزَابَ وَحْدَهُ

ලාඉලාහ ඉල්ලල්ලාහු වල්ලාහු අක්බර්, ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු, ලාෂරීකලහු ලහුල් මුල්කු වලහුල් හම්දු යුහ්යී වයුමීතු වහුව අලා කුල්ලි ශෛඉන් කදීර්. ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දා, අන්ජස වඃදා, වනසර අබ්දා, වහසමල් අහ්සාබ වහ්දා.

යනුවෙන් තුන් වතාවක් උසුරා දීර්ග ලෙස (දුආ) ප්‍රාර්ථනා කළ යුතුයි.

පසුව සෆාවෙන් සිට බැස (සර් කිරීමේදී හමුවන අනෙක් කඳුගැට වන මර්වා) දෙසට ගමන් කළ යුතුයි. කොළපාට සළකුණට ලඟාවූ කළ එතැන් සිට අනෙක් කොළ පාට සළකුණ දක්වා හැකිතාක් සීඝ්‍රයෙන් යාම සුන්නත්ය. මෙසේ යාමේදී කිසියම් කෙනෙකුට හෝ අවහිර නොකිරීම කොන්දේසියකි.

සීඝ්‍රයෙන් යාම පිරිමින්ට පමණි. ස්ත්‍රීන්ට තහනම්ය. මර්වා වෙත පැමිණවිට එහි නැග කඃබා දෙසට හැරී දෑත් ඔසවා සෆාවෙහි කළ පරිදි ප්‍රාර්ථනා කළ යුතුයි. මෙසේ කිරීමෙන් සර් හි වටකිරීම් හතෙන් එකක් අවසන්වේ.

ප්‍රාර්ථනාවෙන් පසු මර්වාවෙන් සිට බැස සෆා දෙසට ගමන් කළ යුතුයි. පළමු වටයේ කළ පරිදිම මෙහිද කළ යුතුයි. සර් කිරීමේ අතරතුර අධිකව ප්‍රාර්ථනා කිරීම සුන්නත්ය.

හජ් තමත්තුඃ කරන්නා සර් (සක්මන්) කළ පසු හිසකෙස් බූ ගසා උම්රාව අවසන්

කොට, තම (සාමාන්‍ය) ඇඳුම් ඇඳගෙන ඉහ්රාමෙන් නිදහස්විය හැක. අටවැනි දින ඔහු සිටින ස්ථානය සිට ලුහර් සලාතයට මදකට පෙර හජ් සඳහා ඉහ්රාම් කළ යුතුයි.

උම්රාවෙ ඉහ්රාමයේදී කළ සියලු දේම මෙහිදීද ඔහු කළ යුතුයි. පසුව හජ් සඳහා (සිතින්) නියියත් කර මෙසේ කිව යුතුයි.

لَبَّيْكَ حَجًّا ، لَبَّيْكَ لاَشَرِيْكَ لَكَ لَبَّيْكَ ، إِنَّ الْحَمْدَ وَالنِّعْمَةَ لَكَ وَالْمُلْكُ لاَ شَرِيْكَ لَكَ

ලෙබ්බයික් හජ්ජන්, ලෙබ්බයික් ලා ෂරීක ලක ලෙබ්බයික්, ඉන්නල්හම්ද වන්නි:මත ලක්, වල්මුල්ක් ලාෂරීක ලක්.

පසු ලුහර්, අසර්, මග්රිබ්, ඉෂා හා ෆජ්ර් සලාතයන් මිනාවේදී කෙටි (කස්ර්) කර ඉටු කළ යුතුයි.

දුල් හජ් 8 වැනි දිනය

හජ් කරන්නා දුල්හජ් මස අට වැනි දින මිනාවට ගොස් එහිදි ලුහර්, අසර්, මග්රිබ්, ඉෂා හා ෆජ්ර් යන සලාතයන් ඉටුකළ යුතුයි. රකඅත් සතරක සලාතයන් රකඅත් දෙකක් ලෙස කෙටි (කස්ර්) කරද ඉටුකළ යුතුයි.

9 වැනි (අරෆා) දිනය

මේදින පහත සඳහන් කාර්යයන් නියම කර ඇති පරිදි කළ යුතුයි.

1-ඉර උදාවීමෙන් පසු හාජිවරයා අරෆාවට ගොස් එහි එදින ඉර බසින තෙක් රැඳී සිටිය යුතුයි. ඉර මුදුනෙන් ඉවත්වන විට ලුහර් හා අසර් සලාතයන් කස්ර් (කෙටි කර) හා ජම්උ (එකතුකර) ඉටුකළ යුතුයි. සලාතයෙන් පසු දික්ර්, (ප්‍රාර්ථනා) හා තල් බියාවෙහි යෙදී සිටිය හැකිය. අධික ලෙස

ප්‍රාර්ථනා කිරීම, අල්ලාහ් වෙත කීකරුවීම, තමා හා පොදුවෙන් මුස්ලිම් වරුන් සඳහා ප්‍රාර්ථනා කිරීම, තමා කැමැති දේ ප්‍රාර්ථනා කිරීම හා ප්‍රාර්ථනා කිරීමේදී තමාගේ දෑත් ඔසවීම යනාදීන් සුන්නත්ය.

අරෆාවෙහි රැඳී සිටීම හජ් කර්තව්‍යයෙහි අනිවාර්ය කරුණකි. එහි රැඳී නොසිටින්නා ගේ හජ් කර්තව්‍යය අවලංගු වේ. එහි රැඳී සිටීමේ කාලය, නව වැනි දින ඉර උදාවීම සිට දස වැනි දින ෆජ්රය උදාවන තෙක්ය.

කවරෙක් හෝ මෙම කාලය තුල දහවල් හෝ රාත්‍රි කාලයේ කෙටි කලක් හෝ රැඳී සිටියේනම් ඔහුගේ හජ් කර්තව්‍යය සම්පූර් ණවේ. අරෆාවේ මායිම්තුල පිවිස සිටින බව තහවුරුකර ගැනීම අනිවාර්ය වේ.

2-අරෆා දින ඉර බැසූ බව තහවුරු වීමෙන් පසු තල්බියා නාද කරමින් සැනසීමෙන් හා කීකරුවෙන් මුස්දලිෆාවට යා යුතුයි.

මුස්දලිෆාව

මුස්දලිෆා වෙත පැමිණ එහි මග්රිබ් හා ඉෂා සලාතයන් කස්රු හා ජම්උ ලෙස (කෙටි කර හා එකතු කර) ඉටු කළ යුතුයි. සලාත යෙන් පසු මහුට කෑම බීම යනාදී කාර්යයන් සූදානම්කළ හැක. ෆජ්ර් සලාතයට සීරුවෙන් නැගිටීම සඳහා කාල වේලාවෙන් නිදාගැනීම උතුම්ය.

10 වැනි (ඊද්) දිනය

1- ෆජ්ර් සලාතයේ වේලාව පැමිණවිට එය ඉටු කළ යුතු අතර, පසුව එම ස්ථානයේ රැඳී සිට සම්පූර්ණයෙන් එළිවන තෙක් අධි කව දික්ර් (භාවනා) හා ප්‍රාර්ථනාවල යෙදී සිටිය යුතුයි.

2-කුඩා ගල් හතක් රැගෙන තල්බියා නාද කරමින් ඉර උදාවීමට පෙර මිනාවට ගමන් කළ යුතුයි.

3-ජම්රතුල් අකබාව (ජම්රතුල් කුබ්රා) ලඟා වන තෙක් තල්බියා නාදකර සිටිය යුතුයි. පසුව ගලක් බැගින් ගල් හතක් ගැසීමේ කාර්ය ආරම්භ කළ යුතුයි. සෑම ගලක් ගැසීමේදීම අල්ලාහු අක්බර් කිව යුතුයි.

4-මහු හජ් තමත්තුඋ හෝ කිරාන් කරන්නා ගල් ගැසීමෙන් පසු සතෙක් කැප කළ යුතු අතර, එයින් මහුද අනුභව කිරීම හා දානය කිරීම සතුටුදායක වේ.

5-කැප කිරීමෙන් පසු තම හිස සම්පූර්ණව බූගැසීම හෝ කොටකර කැපීම වැදගත්ය. බූගැසීම උතුමය. නමුත් ස්ත්‍රීන් හිස කෙස් සෑමහි තම ඇඟිලිතුඩුව (සෙ:මී 3 ක) ප්‍රමාණයක් කැපිය යුතුයි.

මින් පසු හාජි වරයාට ඉහ්රාම් කිරීමෙන් තහනම්වූ ඇදුම් ඇඳීම, සුවඳ විලවුන් ගෑම, නියපොතු කැපීම හා කෙස් ඉවත් කිරීම යනාදීන් කළ හැක. එනමුත්, විවාහ කිරීම පමණක් කාඃබාව සක්මන් කිරීම දක්වාම

නහනම්න් පවතී. මින්පසු හාජිවරයා නැම, පිරිසිදු කිරීම, සුවඳ විලවුන් තැවරීම හා ඇඳුම් ඇඳීම සතුටු දායකය.

6-හජ් කර්තව්‍යයෙහි තවාෆුල් ඉෆාලා කිරීම සඳහා මස්ජිදුල් හරාම් (කාඃබා) වෙත යා යුතුයි. එහි සක්මන් කිරීමෙන් පසු රකඅත් දෙකකින් සමන්විත සලාතයක් ඉටු කළ යුතුයි. පසුව සඊ කරන ස්ථානයට ගොස් සෆා හා මර්වා අතර සක්මන් (හත් වටක්) කළ යුතුයි. සඊ කිරීමෙන් පසුව ඉහ්රාම් කිරීම සඳහා නහනම්වූ ලිංගික ආශ්වාදය ඇතුලු සියලු දේ අනුමත වේ.

7-හාජිවරයා 11 හා 12 වැනි දින (ප්‍රමාදවී පිටත් වන්නන් 13 දිනද) රාත්‍රීන් මිනාවෙහි නැවතීම අවශ්‍යවේ. එනම් රාත්‍රියෙහි අධික වේලාවක් මිනාවෙහි ගතකළ යුතුයි.

ගල් ගැසීම, කැපීම, හිසකෙස් බූගැසීම හා තවාෆ් කිරීම යනාදින් පිළිවෙළට ඉටු කිරීම සුන්නත්ය.

11 වැනි දිනය

හාජ් කරන්නා මේදින ගල් ගැසීම අනිවාර්යවේ. ඉර මුදුනෙන් ඉවත්වූ අවස්ථාවේ සිට ගල් ගැසීමේ කාලය ඇරඹේ. එය මෙයට පෙර කළ නොහැක. සවාල් (ඉර මුදුනෙන්) ඉවත්වූ පසු කුමන වේලාවේ හෝ ජම්රතුල් සු(ක්)හ්රාවෙන් ආරම්භකර, පසු ජම්රතුල් වුස්තාවෙහිද පසුව ජම්රතුල් කුබ්රාවෙහිද ගල් ගැසීමේ කාර්ය ඉටුකළ යුතුයි.

ගල් ගැසීමේ ක්‍රම

1-තමා සමග කුඩා ගල් විසි එකක් රැගෙන ජම්රතුල් සු(ක්)හ්රා කරා ගොස් එහි ගල් හතක් ගැසිය යුතුයි. සෑම ගලක් ගසන විටම අල්ලාහු අක්බර් යැයි කිව යුතුයි. එම ගල් පොකුණතුල වැටීමට අවධානය යොමු කළයුතු අතර, ගලක් බැගින් (ගල් හතක්) ගැසිය යුතුයි. පසුව දකුණු දෙසට ගොස්

එහි රැඳීසිට දීර්ඝ වශයෙන් ප්‍රාර්ථනා කිරීම සුන්නත්ය.

2-පසුව ජමරතුල් වුස්තා කරා ගොස් එහිදී ගලක් බැගින් ගල් හතක් ගැසිය යුතුයි. සෑම ගලක් සඳහාම අල්ලාහු අක්බර් කිව යුතුයි. පසුව වම් දෙසට ගොස් එහි දීර්ඝව ප්‍රාර්ථනා කිරීම සුන්නත්ය.

3-පසුව ජම්රතුල් කුබ්රා වෙත ගොස් එහිද ගල් හතක් ගැසිය යුතුයි. සෑම ගලක් ගැසීමේදීම අල්ලාහු අක්බර් කිව යුතුයි. මින්පසු එහි රැඳී නොසිටිය යුතුයි.

12 වැනි දිනය

1-එකොළොස් වැනි දින කළ කාර්යයන් මේදිනද ඉටුකළ යුතුයි. හාජිවරයා ප්‍රමාදවී 13 වැනි දිනද රැඳී සිටීමට අදහස් කරන්නේනම්, එය උතුම්ය. එබැවින් මහු 11 හා 12 දිනයන්හි කළ කාර්යයන් මේදිනද ඉටු කළ යුතුයි.

2-12 හෝ 13 දින ගල් ගැසීමෙන් පසු හාජි වරයා කා:බාව වටා සක්මන් (සමුගැනීමේ තවාෆයට අයත් වට කිරීම් හතක්) කිරීම සඳහා කා:බාව කරා යායුතුයි. පසුව පහසු වන්නේනම්, මකාමේ පිටුපසින් හෝ මස්ජි දයෙහි කුමන ස්ථානයක රකඅත් දෙකක සලාතයක් ඉටු කළ යුතුයි. මෙම වාෆය ඔසප්වූ හා දරු ප්‍රසූතයෙන් පසු රුධිරය පිටත්වන ස්ත්‍රීන්ට අදාල නොවන්නේය.

3-පසුව හාජිවරයා කිසියම් කාර්යයක හෝ නොයෙදීම වාජිබ්ය. නමුදු ඔහු තම කාලය භාවනා (දික්ර්) කිරීම, ප්‍රාර්ථනා කිරීම හා ප්‍රයෝජනවත් දේට සවන්දීම යනාදියන්හි යෙදමින් මක්කාව සිට පිටත්විය යුතුයි.

තවාෆයෙන් පසු තමන්ගේ මිත්‍රයන් බලා පොරොත්තුවීම හෝ තම බඩුබාහිර ආදීන් රැගෙන ඒම හෝ මගෙහි අවශ්‍යවන දේ මිළදී ගැනීම හෝ මෙවැනි දේ සඳහා මදක් රැඳී සිටීමෙන් ප්‍රශ්නයක් නොවන්නේය.

අර්කානුල් හජ්

1-ඉහ්රාම් කිරීම.
2-අරෆාවෙහි රැඳී සිටීම.
3-(අවුරුදු දින) තවාෆුල් ඉෆාලා කිරීම.
4-සෆා හා මර්වා අතර සඊ කිරීම

මේවායින් කුමක් හෝ ඉටු නොකළේ නම්, ඔහුගේ හජ් කර්තව්‍යය අවලංගු වේ.

වාජිබාතුල් හජ්

1-නියමිත මීකාතයෙහි ඉහ්රාම් කිරීම.
2-දහවල් කාලයේ අරෆාවේ රැඳී සිටින්නන් ඉර බසින තෙක් රැඳී සිටීම.
3-දුර්වලවන්තයන් හා ස්ත්‍රීන් හැර අන් අය ෆජ්ර් උදාවී සම්පූර්ණයෙන් එළිවන තෙක් මුස්දලිෆාවෙ නැවතී (ලැගුම් ගෙන) සිටීම. දුර්වල වන්තයන් සහ ස්ත්‍රීන් අර්ධ රාත්‍රිය දක්වා සිටිය හැක.

4-තෂ්රීක් (දුල් හජ් මස 11,12,13) දිනයන් රාත්‍රී කාලයේ මිනාවෙහි රැඳී සිටීම.
5-තෂ්රීක් දිනයන්හි ගල් ගැසීම.
6-හිසකෙස් බූගැසීම / කොටකර කැපීම.
7-තවාෆුල් විදාඋ කරීම.

මෙයින් කුමක් හෝ නොකළේ නම්, ඔහු දමුව (කැපීම)ක් ලෙස කෙනෙකුට එළුවෙක් හා හත් දෙනෙකුට ගවයෙක් හෝ ඔටුවෙක් බැගින් කපා හරම්හි දිළින්දන්ට දිය යුතුයි.

නබිතුමාගේ මස්ජිදය

නබිනායක මුහම්මදු (සල්) තුමාගේ මස් ජිදයෙහි සලාතය ඉටුකිරීම සඳහා එහි යාම සතුටුදායක ක්‍රියාවෙකි. නබිතුමාගේ මස්ජිද යෙහි සලාතයක් ඉටු කිරීම මස්ජිදුල් හරාම් දේවස්ථානය හැර අන් දේවස්ථානවල සලාත යන් දහසක් (1000) ඉටු කිරීමට වඩා උතුම් බව නබිවදන් මගින් දැනගන්නට ලැබී ඇත.

මෙම දේවස්ථානය බැහ දැකීම සෑම කාලය සඳහාම නියම කර ඇත. මේ සඳහා විශේෂ වේලාවන් නොමැත. මෙය හජ් කර්තව්‍යයට අදාල කරුණක්ද නොමැත.

මුස්ලිම්වරයා මෙම දේවස්ථානයෙහි රැඳී සිටින තුරු නබි මුහම්මදු (සල්) තුමාගේ හා එතුමාගේ අනුගාමිකයන්වූ අබූබක්ර් (රලි) හා උමර් (රලි) තුමානන්ගේ සමාධියන් බැහ දැකීම සතුටුදායකය. සමාධියන් බැහ දැකීම ස්ත්‍රීන්ට හැර පිරිමින්ට පමණක්ය. නබිතුමාගේ කාමරයේ කිසියම් දෙයක් ඇල්ලීම හෝ එය තවාෆ් කිරීම හෝ ප්‍රාර්ථනා කිරීමේ දී එය මුහුණපා සිටීම හෝ කළ නොහැක.

උම්රා කර්තව්‍යය
أحكام العمرة

සෑම මුස්ලිම්වරයාටම තම ජීවිතයේ එක් වරක් උම්රාව ඉටුකිරීම අනිවාර්ය වේ. මන්ද යත්, මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

අල්ලාහ් වෙනුවෙන් හජ් හා උම්රාව සම් පූර්ණ(යෙන් ඉටු) කරන්න.
(අල්කුර්ආන්-2:196)

උම්රාව මුස්ලිම් වරයෙක් තම හැකියාවන් අනුව නැවත නැවත කළයුතු උතුම් ක්‍රියාවකි. ඒ සඳහා ප්‍රථමයෙන් ඉහ්රාම් කළ යුතුයි.

ඉහ්රාම් කිරීම

ඉහ්රාම් යනු උම්රා කර්තව්‍යයෙහි පිවිසී මකි. ඉහ්රාම් කිරීමෙන් එයට පෙර අනුමත

සමහර කාර්යයන් තහනම් වේ. මන්ද, ඔහු ඇඳහිමක පිවිස සිටී. උම්රාවෙහි යෙදෙන්නා ඉහ්රාම් කිරීම අනිවාර්ය වේ. මක්කාවෙන් පිටත සිට උම්රා කිරීම සඳහා පැමිණෙන්නා මුහම්මදු (සල්) තුමා නියමකළ මායිම් එකක දී ඉහ්රාම් කළ යුතුයි.

මීකාත් - මායිම්

1-තුල්හුලයිෆා :

මෙය මදීනාවට යාබදව පිහිටා ඇති කුඩා ගම්මානයකි. මෙය දැනට අබ්යාර් අලි යනු නමින් හැඳින්වේ. මෙය මදීනා වැසියන්ගේ මායිමය.

2-අල් ජුහ්ෆා :

මෙය රාබිහ් ප්‍රදේශයට යාබදව පිහිටා ඇති කුඩා ගමකි. දැනට මිනිසුන් රාබිහ් සිට ඉහ්රාම් කරති. මෙය ෂාම් (සිරියා) වාසීන්ගේ මායිමය.

3-කර්නුල් මනාසිල් (අස්සයිලුල් කබීර) :

මෙය තායිෆ් නගරයට යාබදව පිහිටා ඇති ස්ථානයකි. මෙය නජ්ද් වාසීන්ගේ මායිමය.

4-යලම්ලම් :

මෙය මක්කා නගරයේ සිට කිලෝ මීටර 70 ක දුරින් පිහිටා ඇති ස්ථානයකි. මෙය යෙමන් වැසීන්ගේ මායිමය.

5-දාතු ඉර්ක් :

මෙය ඉරාක් වැසියන්ගේ මායිමය.

මෙම මායිම් සියල්ල ඉහත සඳහන් ප්‍රදේශ වාසීන් හා එම මායිම් මාර්ගයෙන් හජ් හා උම්රා කර්තව්‍යය ඉටුකිරීම සඳහා පැමිණෙන් නන් සඳහා නබිනායක මුහම්මදු (සල්) තුමා නියම කළ මායිම්වේ. මක්කාවේ සිටින්නන් හා හිල් (හරම්හි පිටත වසන) ප්‍රදේශ වාසීන් තමන් සිටින ස්ථානයෙහි සිටම ඉහ්රාම් කළ හැක.

ඉහ්රාම් හි සුන්නත්

ඉහ්රාම් කිරීමට පෙර කළයුතු සතුටුදායක කාර්යයන් මෙසේය.

1-නියපොතු කපා ගැනීම, කිහිල්ල දෙකහි රෝමයන් ගැලවීම හෝ බූගෑසීම, උඩුරැවුල කැපීම, ආවරණ ප්‍රදේශයේ රෝම බූගෑසීම, නෑම හා සුවඳ විලවුන් ගෑම යනාදීන්. සුවඳ විලවුන් ගෑම ඇඳුමෙන් තොරව ශරීරයට පමණක් විය යුතුයි.

2-මැසූ ඇඳුම් ගැලවීම හා උඩු (සළුව) සහ යටි (සරම) ඇඳුම් ඇඳීම. ස්ත්‍රීන් තම ශරීරය ආවරණය කිරීමට උනන්දු විය යුතු අතර, තමන් කැමැති ඇඳුම්ද ඇඳීමට හැක. තම අලංකාර නොපෙන්වීම, අන් පිරිමින් පැමිණෙන අවස්ථාවල තම මුහුණ හා බාහුවන් ආවරණය කිරීම හා අත් වැසුම සහ මුහුණු වැසුම පැළඳීමෙන් වැළකී සිටීම.

3–මස්ජිදයට යාම. එය අනිවාර්ය සලාතයේ වේලාව නම්, එම සලාතය ජමාඅත් (සමූහ) වශයෙන් ඉටුකිරීම. එය සලාතයේ වේලාව නොවන්නේ නම්, වුළුවෙහි (දෝවනයෙහි) සුන්නතයක් වශයෙන් රකඅත් දෙකකින් සමන්විත සලාතයක් ඉටු කිරීම. පසුව ඉහ් රාම් කිරීම.

ඉහ්රාම්හි ක්‍රමය

ඉහ්රාම් කරන්නා ලෙබ්බයික උම්රතන් (යාඅල්ලාහ්, උම්රා කිරීම සඳහා ඔබ ඉදිරියට පැමිණ සිටිමි) යනුවෙන් කිව යුතුයි.

උම්රාව ඉටු කරන්නා ගුවන් මාර්ගයෙන් ගමන් කරන්නෙකු නම්, මීකාතයෙහි හෝ මීකාතය දැනගැනීමට අපහසු වන්නේ නම්, මීකාතය පැමිණීමට පෙර ප්‍රමාණවත් කාලයේ හෝ ඉහ්රාම් කළ යුතුයි. මීකාතයේ කළයුතු පිරිසිදු කිරීම, සුවඳ විලවුන් ගැම, නියපොතු

කැපීම හා ඉහ්රාම් ඇඳුම් ඇඳීම යනාදියන් කැමැත්ත පරිදි ගුවන් යානයේ නැගීමට පෙර හෝ ගුවන් යානය තුල හෝ සම්පූර්ණයෙන් කළ යුතුයි. පසුව මීකාතය ලඟා වීමට පෙර හෝ එය ලඟාවූ විට ඉහ්රාම් සඳහා නියියත් කළ යුතුයි.

ඉහ්රාම් කළායින් පසු තල්බියාව උසුරීම හා එය ඉහ්රාම් කළ වේලාවේ සිට කඃබාව තවාෆය ආරම්භ කරන තෙක් නැවත නැවත උසුරීම සුන්නත්ය. එම තල්බියාව මෙසේය.

لَبَّيْكَ اللَّهُمَّ لَبَّيْكَ ، لَبَّيْكَ لاَ شَرِيْكَ لَكَ لَبَّيْكَ ، إِنَّ الْحَمْدَ وَالنِّعْمَةَ لَكَ وَالْمُلْكُ لاَ شَرِيْكَ لَكَ.

ලෙබ්බයික් අල්ලාහුම්ම ලෙබ්බයික්, ලෙබ්බයික් ලාෂරීක ලක ලෙබ්බයික්, ඉන්නල් හම්ද වන්නි:මත ලක් වල්මුල්ක් ලාෂරීක ලක්.

(ඔබ වෙත පැමිණ සිටිමි. යා අල්ලාහ්, ඔබ වෙත පැමිණ සිටිමි. ඔබ වෙත පැමිණ සිටිමි.

ඔබට කිසියම් සහකරුවෙක් නොමැත. ඔබ වෙත පැමිණ සිටිමි. නියත වශයෙන්ම ප්‍රශංසාව, දායාදය හා පාලනය ඔබ සතුය. ඔබට කිසියම් සහකරුවෙක් නොමැත)

ඉහ්රාම් හි තහනම් කරුණු

ඉහ්රාම් කළ අයට ඉහ්රාම් කිරීමට පෙර අනුමතවු සමහර කාර්යයන් තහනම් වේ. මක්තිසාදයන්, ඔහු (ඇඳහීමෙහි) පිවිස සිටී. ඔහුට පහත සඳහන් කාර්යයන් තහනම්ය.

1-හිසකෙස් හා ශරීරයෙහි ඇති රෝම ඉවත් කිරීම. පහසුවෙන් හිස කැසීමෙන් (මගින් රෝම හැලීමෙන්) ප්‍රශ්නයක් නොමැත.

2-නියපොතු කැපීම. නමුත්, එය කැඩී හෝ බාධවක් ලෙස හෝ පවතින්නේ නම්, එය ඉවත් කිරීමෙන් ප්‍රශ්නයක් නොවන්නේය.

3-සුවඳ විලවුන් හා සුවඳ සබන් යනාදියන් භාවිතා කිරීම.

4-ලිංගික ආශ්වාදයන්හි යෙදීම සහ විවාහ කිරීම, කාම හැඟීමෙන් බැලීම, ආලිංගනය කිරීම, සිඹීම .හා මෙවැනි ලිංගික ආශ්වාද උනන්දු කරන කාර්යයන්හි යෙදීම.

5-අත් දෙකට අත් (මේස්) වැසුම් පැළඳීම.

6-දඩයම් සතුන් මැරීම.

මේවා සියල්ල පිරිමින් හා ස්ත්‍රීන් දෙපිරිස ටම තහනම්ය. නමුත්, මෙයට අමතරව පිරිමින්ට පහත සඳහන් කාර්යයන්ද තහනම්ය.

1-මැසූ ඇඳුම් ඇඳීම. නමුදු ඉහ්රාම්කර සිටින අයට අවශ්‍ය පටිය, අත්ඔරලෝසුව හා ඇස් කණ්නාඩිය යනාදීන් පැළඳීමෙන් ප්‍රශ්නයක් නොමැත.

2-හිසට ගැවෙන පරිදි හිස් වැසුම් පාවිච්චි කිරීම. එනමුත් හිසට නොගැවෙන කුඩය, වාහනය, කුඩාරම යනාදීන් පාවිච්චි කිරීමෙන් ප්‍රශ්නයක් නොමැත.

3-පා වැසුම් පැළඳීම. පාවහන් නොවන්නේ නම්, සපත්තුව පැළඳිය හැක.

මෙවායින් කිසියම් කාර්යයක් කරන්නා ස්ථාවර තුනකට ඇතුලත්වේ.

අ-හේතුවකින් තොරව කරන්නා. ඔහු පව් කාරයාය. ඔහු ප්‍රතිකාරයක් කළ යුතුයි.

ආ-අවශ්‍යතාවයක් මත කරන්නා. ඔහු පව් කාරයා නොවන්නේය. එනමුත් ඒ සඳහා ඔහු ප්‍රතිකාරයක් කළ යුතුයි.

ඉ-නොදැනීම, අමතක වීම, බල කිරීම හෝ මෙවන් හේතු මත කරන්නා. ඔහුට පවක් නාමැත. ඔහු ඒ සඳහා ප්‍රතිකාරයක් කළ නොයුතුයි.

තවාෆ් කිරීම

මස්ජිදුල් හරාම් දේවස්ථානයට පිවිසෙන කළ දකුණු පය තබා මෙසේ උසුරීම සුන්නත්ය.

බිස්මිල්ලාහි වස්සලාත්තු වස්සලාමු අලා රසූලිල්ලාහි. අල්ලාහුම් මහ්ෆිර්ලී දුනූබී වෆ් තහ්ලී අබ්වාබ රහ්මතික.

بِسْمِ اللهِ وَالصَّلاَةُ وَالسَّلاَمُ عَلَى رَسُوْلِ اللهِ ، اَللّٰهُمَّ اغْفِرْلِيْ ذُنُوْبِيْ وَافْتَحْ لِيْ أَبْوَابَ رَحْمَتِكَ.

අල්ලාහ්ගේ නාමයෙන් පිවිසීමි. සාමය හා සමාදානය අල්ලාහ්ගේ දූතයා වෙත හිමිවනු මැනවි. ස්වාමිනි, මගේ පාපයන් වෙනුවෙන් සමාව ලබාදී ඔබගේ කරුණාවේ දොරටුව මා වෙනුවෙන් විවෘත කර දෙනු මැනවි.

මෙම ප්‍රාර්තනාව සෑම දේවස්ථානයටම පොදුය. පසුව තවාෆ් කිරීම සඳහා කඃබාව දෙසට මුහුණපා සිටිය යුතුයි.

තවාෆ් යනු, අල්ලාහ්ට වැඳුම් පිඳුම් කිරීමේ චේතනාවෙන් හජරුල් අස්වද (කළු ගලෙන්) ආරම්භය හා අවසානය වන පරිදි කඃබාව තම වමට එනුසේ හත් වරක් කඃබාව (සක් මන්) වටේ ගමන් කිරීමකි. මේ වෙනුවෙන් වුලූකර සිටීම (වාජිබ්) අනිවාර්ය වේ.

තවාෆ් හි ක්‍රම

1-හජරුල් අස්වද් (කළුගල) දෙසට ගොස් එය තම දකුණු අතින් අල්ලා 'බිස්මිල්ලාහි වල්ලාහු අක්බර්' යැයි උසුරිය යුතු අතර, පහසු වන්නේනම්, එය සිඹිය යුතුයි. එයට පහසු නොවන්නේ නම්, එය අතින් අල්ලා එම අත සිඹිය යුතුයි. එය ඇල්ලීමටද පහසු නොවන්නේ නම්, ඒ දෙසට මුහුණපා තම අත් සංඥා කර අල්ලාහු අක්බර් යනුවෙන් උසුරිය යුතු අතර, අත නොසිඹිය යුතුයි.

පසුව කඃබාව තමාගේ වමට යොදා තවාෆය ආරම්භ කළ යුතුයි. තමා කැමැති දුආවන් ප්‍රාර්ථනා කළ හැකිය. නොඑසේ නම්, තමා දන්නා තරම් අල්කුර්ආනය පාරායනා කළ හැක. හජ් කරන්නා තම භාෂාවෙන් තමා හා තමා කැමැති අය වෙනුවෙන් ප්‍රාර්ථනා කළ හැක. මෙහි ප්‍රාර්ථනා කිරීමට විශේෂ ප්‍රාර්ථනාවන් නොමැත.

2-රුක්නුල් යමානි වෙතට පැමිණා විට පහසු වුවද, එය අතින් අල්ලා බිස්මිල්ලාහි වල්ලාහු අක්බර් යනුවෙන් උසුරිය යුතු අතර, තම අත නොසිඹිය යුතුයි. එයට අපහසු වන්නේ නම්, අඛණ්ඩව ගමන් කරමින් සිටින අතර තුර, තම අතින් සංඥා නොකර තක්බීරයද නොකිව යුතුයි. එය (රුකුනුල් යමානි) හා හජරුල් අස්වද් අතරෙහි මෙසේ ප්‍රාර්තනා කළ යුතුයි.

رَبَّنَا آتِنَا فِي الدُّنْيَا حَسَنَةً وَّفِي الْآخِرَةِ حَسَنَةً
وَّقِنَا عَذَابَ النَّارِ

රබ්බනා ආත්තිනා ෆිද් දුන්යා හසනතන් ව ෆිල් ආ(ක්)හිරති හසනතන් වකිනා අදා බන්නාර්

යා අල්ලාහ්, මෙලොවෙහිද පරලොවෙහි ද යහපත ලබාදෙනු මැනවි. තවද, නිරයෙහි වේදනාවෙන් ර්‍යකගනු මැනවි.

3-හජරුල් අස්වද් වෙත පැමිණිවිට එය තම අතින් ඇල්ලිය යුතුයි. එය අපහසු වන්නේ නම්, තම අතින් සංඥාකර අල්ලාහු අක්බර් යනුවෙන් කිව හැක. මෙසේ කිරීමෙන් තවාෆ්හි සක්මන් එකක් අවසන්වේ. ඉතිරි වටකිරීම්ද මෙසේම සම්පූර්ණ කළ යුතුයි.

4-තවාෆය කරමින් සිට වටකිරීම් හතම සම්පූර්ණවන තෙක් පළමු වටයෙහි කළ පරිදිම කළ යුතුයි. හජරුල් අස්වද පසුකරන සෑම විටද, හත්වන වටයෙන් පසුද අල්ලාහු අක්බර් යනුවෙන් තක්බීරය කිව යුතුයි.

ප්‍රථම වට තුනකදී කුඩා අඩි තබාගෙන වේගයෙන් ගමන් කිරීම සුන්නත්ය. මෙය අල් රම්ලු යනුවෙන් හැඳින්වේ. ඉතිරි වටවල සාමාන්‍යයෙන් ඇවිදීම සුන්නත්ය.

එසේම, මෙම තවාෆ් සෑමහිම සළුව තමාගේ දකුණු කිහිල්ල මාර්ගයෙන් ගෙන එහි කොණ් දෙක වම් උරහිස මත තබා වසාගත යුතු අතර, දකුණු උරහිස පමණක් විවෘතව

පවතිය යුතුයි. මෙය අල් ඉල්තිබාඋ යනුවෙන් හැඳින්වේ. අල් රම්ලු (කුඩා අඩි තබා ගමන් කිරීම) හා අල් ඉල්තිබාඋ (සළුව පිළිවෙලට ඇඳීම) හජ් හා උම්රා කර්තව්‍යය වෙනුවෙන් මක්කාවට පිවිසෙනවිට කරන ප්‍රථම තවාෆය සඳහා පමණි.

තවාෆයෙන් පසු

තවාෆය කිරීමෙන් පසු මකාමේ ඉබ්රාහීම් පිටුපස රකඅත් දෙකකින් සමන්විත සලාතයක් ඉටු කිරීම සුන්නත්ය. මෙම අවස් ථාවේ මකාමය ඔහුට සහ කාඃබාවට අතරව පවතී. සලාතයට පෙර සළුව ඇඳිය යුතුයි. එනම් සළුව උරහිස බාහුවන් දෙක හා පපුව මත තබා වසාගත යුතුයි.

පළමු රකඅතෙහි ෆාතිහා හා කාෆිරූන් පරිච්ඡේදයන්ද, දෙවැනි රකඅතෙහි ෆාතිහා හා ඉහ්ලාස් පරිච්ඡේදයන්ද පාරායනය කළ

යුතුයි. අධික තදබදය හේතුවෙන් මකාමෙහි පිටුපසින් සලාතය ඉටු කිරීමට අපහසු නම්, දේවස්ථානයේ කුමන ස්ථානයක හෝ එය ඉටුකළ හැක. පසු සම්සම් ජලය වැඩියෙන් (කුස පිරන තෙක්) පානය කිරීම සුන්නත්ය.

සඊ කිරීම

සම්සම් ජලය පානය කිරීමෙන් පසු සඊ (සක්මන්) කරන ස්ථානයට යා යුතුයි. එනම් (සඊ කිරීමේදී හමුවන පළමු කඳු ගැටයවන) සෆා වෙත ගොස් එය ලඟාවූ විට පහත සඳහන් කුර්ආන් පාඨය පාරායනා කළ යුතුයි.

﴿إِنَّ الصَّفَا وَالْمَرْوَةَ مِنْ شَعَآئِرِ اللهِ﴾ [٢: ١٥٨]

ඉන්නස් සෆා වල්මර්වත මින් ෂආඉරිල්ලාහ්

නියතව, සෆා හා මර්වා (යන කඳු ගැට) අල්ලාහ්ගේ චිහ්න (සළකුණු) යන් අතරවේ.

(අල්කුර්ආන් - 2:185)

අනතුරුව කෑබාව පෙණෙන තෙක් සෆා කඳු ගැටයට නැග කෑබා දෙසට හැරී දෑත් ඔසවා අල්ලාහ් ප්‍රශංසා කර කැමැති ප්‍රාර්ථනාවන් කළ හැක. ප්‍රාර්ථනාවක් මෙසේය.

لاَ إِلَهَ إِلاَّ اللهُ وَاللهُ أَكْبَرْ، لاَ إِلَهَ إِلاَّ اللهُ وَحْدَهُ لاَ شَرِيْكَ لَهُ ، لَهُ الْمُلْكُ وَلَهُ الْحَمْدُ يُحْيِيْ وَيُمِيْتُ وَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِيْرٌ ، لاَ إِلَهَ إِلاَّ اللهُ وَحْدَهُ أَنْجَزَ وَعْدَهُ وَنَصَرَ عَبْدَهُ وَهَزَمَ الْأَحْزَابَ وَحْدَهُ

ලාඉලාහ ඉල්ලල්ලාහු වල්ලාහු අක්බර්, ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු, ලාශරීකලහු ලහුල් මුල්කු වලහුල් හම්දු යුහ්යී වයුමීතු වහුව අලා කුල්ලි ශෛඉන් කදීර්. ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දා, අන්ජස ව:දා, වනසර අබ්දා, වහසමල් අහ්සාබ වහ්දා.

යනුවෙන් තුන් වතාවක් උසුරා දීර්ග ලෙස (දුආ) ප්‍රාර්ථනා කළ යුතුයි.

පසුව සෆාවෙන් සිට බැස (සඅ කිරීමේදී හමුවන අනෙක් කඳුගැට වන මර්වා) දෙසට ගමන් කළ යුතුයි. කොළපාට සළකුණට ලඟාවූ කළ එතැන් සිට අනෙක් කොළ පාට සළකුණ දක්වා හැකිතාක් සීඝ්‍රයෙන් යාම සුන්නත්ය. මෙසේ ගමන් කිරීමේදී කිසියම් කෙනෙකුට හෝ අවහිර නොකිරීම කොන් දේසියකි.

සීඝ්‍රයෙන් යාම පිරිමින්ට පමණි. ස්ත්‍රීන්ට තහනම්ය. මර්වා වෙත පැමිණවිට එහි නැග කඃබා දෙසට හැරී දෑත් ඔසවා සෆාවෙහි කළ පරිදි ප්‍රාර්ථනා කළ යුතුයි.

මෙසේ කිරීමෙන් සඅහි වටකිරීම් හතෙන් එකක් අවසන්වේ.

ප්‍රාර්ථනාවෙන් පසු මර්වාවෙන් සිට බැස සෆා දෙසට ගමන් කළ යුතුයි. පළමු වටයේ කළ පරිදිම මෙහිද කළ යුතුයි. සඅ කිරීමේ අතරතුර අධිකව ප්‍රාර්ථනා කිරීම සුන්නත්ය.

අර්කානුල් උම්රා

1-ඉහ්රාම් කිරීම.
2-තවාෆ් කිරීම.
3-සර් කිරීම

මේවායින් කුමක් හෝ නොකළේ නම්, ඔහුගේ උම්රාව අවලංගුවේ.

වාජිබාතුල් උම්රා

1-නියමිත මීකාතයෙහි ඉහ්රාම් කිරීම.
2-හිසකෙස් බූගෑසීම හෝ කැපීම.

මේවායින් කුමක් හෝ නොකළේ නම්, ඔහු හරම්හි සිටින දිළින්දන්ට දමුවක් (කැපීමක්) දිය යුතුයි.

وصلى الله على نبينا محمد وعلى آله وصحبه وسلم
والحمد لله رب العالمين.